# ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ සිසු සංජානනය කෙරෙහි, සිසු ඉගෙනුම් ප්‍රවේශ සහ ගුරු ඉගැන්වීමේ ප්‍රවේශ වල බලපෑම

# The Influence of Students Learning Approaches and Teachers Teaching Approaches on Students' Perceptions of Teaching and Learning

කොළඹ විශ්ව විද්‍යාලයේ දර්ශනශූරී උපාධිය (අධ්‍යාපන විද්‍යා) සම්බන්ධ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධනය

UCLIB
539971

ඩබ්ලිව්. ඒ. ආර්. වික්‍රමාරච්චි

2003 / Ph.D. / 01

2006

# සාරාංශය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ විවිධ ඉගෙනුම් ප්‍රවේශ සහිත අ.පො.ස (උ.පෙ) සිසුන් විසින් වෙනස් ඉගැන්වීමේ ප්‍රවේශ සහිත ගුරුවරුන්ගේ රසායන විද්‍යාව ඉගැන්වීම සහ සිය ඉගෙනීම සංජානනය කරන ආකාරය අන්වේශනය කිරීමයි.

මාටන්, 1975 (Marton, 1975) දී සිසුන් විසින් යොදාගනු ලබන ප්‍රධාන ඉගෙනුම් ප්‍රවේශ දෙකක් හඳුන්වා දෙන ලදී. ඉන් එක් ප්‍රවේයක් වන්නේ, සිසුන් අර්ථවත් ඉගෙනුමක් කරා යොමු කරවන ගැඹුරු ඉගෙනුම් ප්‍රවේශය වන අතර අනෙක අවබෝධයකින් තොරව කරුණු සිහිකැඳවීම මගින් ඉගෙන ගන්නා පෘෂඨීය ඉගෙනුම් ප්‍රවේශයයි. තවද ඉගැන්වීම පිළිබඳ පර්යේෂණ සාහිත්‍යය තුළ, සක්‍රිය ඉගැන්වීවේ උපාය මාර්ග භාවිතා වන ශිෂ්‍ය කේන්ද්‍රිය ප්‍රවේශය සහ සම්ප්‍රදායික ක්‍රමයට දැනුම පවරා දෙන ගුරු කේන්ද්‍රිය ප්‍රවේශය යනුවෙන් ඉගැන්වීමේ ප්‍රවේශ දෙකක් අනාවරණය කර ඇත.

මෙම අධ්‍යයනයේදී දත්ත රැස්කිරීම සඳහා, මහනුවර කලාපයට අයත් පාසල් 5 ක උසස් පෙළ විද්‍යාව හදාරණ සිසුන් 385 කින් යුත් නියැදියක් සහ රසායන විද්‍යාව ගුරුවරුන් 10 දෙනකු යොදාගනු ලැබිණ. මෙම සිසු නියැදිය කොටස් දෙකකින් යුත් ලිඛිත ප්‍රශ්නාවලියකට පිළිතුරු සැපයූ අතර එහි පළමු කොටසට අයත් වූයේ බිග්ස්, 1987 (Biggs, 1978) හඳුන්වා දුන් LPQ (Learning Process Questionnaire) නම් වූ සම්මත ප්‍රනාවලියයි. එය සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවේශ හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලැබිණ. අදාළ පන්ති කාමරය තුළ රසායන විද්‍යාව ඉගැන්වීම සහ ඉගෙනීම සංජානනය කරන ආකාරය, විවෘත අන්ත සහිත ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමට අවකාශ සලසා දීම දෙවන කොටසින් සිදුවිය. මීට අමතරව අදාළ ගුරුවරයාට අයත් එක් පන්ති කාමරයකින්, වෙනස් ඉගෙනුම් ප්‍රවේශ වලට අයත් සිසුන් හතර දෙනා බැගින් 40 කින් යුත් සිසු නියැදියක් සහ ගුරු නියැදිය සම්මුඛ

සාකච්ජා සඳහා යොදා ගන්නා ලදි. මෙම සම්මුඛ සාකච්ජා ඉගෙනීම සහ ඉගැන්වීම සංජානනය කරන ආකාරය, ගුරුවරයාගේ සහ ශිෂ්‍යයාගේ පර්යාලෝකයට අනුව විමසීම සඳහා සැලසුම් කෙරිණ. ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ප්‍රවේශ හඳුනා ගැනීම සඳහා ට්‍රිග්වෙල් සහ ප්‍රොසර්, 1996 (TRigwell & Prosser, 1996) ගේ ATI (Approaches to Teaching Inventory) යන ප්‍රශ්නාවලියත් පන්ති කාමර නිරීක්ෂණයත් භාවිතා විය.

දත්ත විශ්ලේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම වේදයන්ට අනුව සිදු කරන ලදි. එම ප්‍රතිඵල වලට අනුව අනාවරණය වුයේ ගැඹුරු ඉගෙනුම් ප්‍රවේයක් සහිත සිසුන්, නිර්මාණශීලී වූ ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගැන්වීමේ ක්‍රම, ඉගෙනීමට වඩාත් යෝග්‍ය ලෙස සංජානනය කරන බවයි. නමුත් මෙම ඉගැන්වීමේ උපාය මාර්ග පෘෂ්ඨීය ඉගෙනුම් ප්‍රවේයක් සහිත සිසුන්ගේ ඇගයීමට ලක් නොවිය. තවද සම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රම අනුගමනය කරන විට සියළුම සිසුන් කරුණු සිහි කැඳවමින් පමණක් ඉගෙනීමෙහි යෙදෙන බව පැහැදිළි විය. මෙම ප්‍රතිඵල කැම්ප්බෙල් සහ පිරිස 1996, 2001 (Campbell et al, 1996, 2001) කරන ලද අත්හදා බැලීම් වලින්ද තහවුරු වන අතර විශේෂයෙන් පෘෂ්ඨීය ඉගෙනුම් ප්‍රවේයක් අනුගමනය කරන සිසුන්ට, විවිධ සක්‍රිය ඉගෙනුම් අත්දැකීම් යොදා ගනිමින් ඉගෙනීමේ කුශලතා අත්කර දියයුතු බව හෙළිදරව් විය.

## Abstract

The purpose of this study is to investigate how students with different learning approaches perceive different approaches used by teachers teaching Chemistry in the G.C.E. (A/L) classes and their own learning.

Marton (1975) has introduced two main learning approaches used by students. The first is the deep approach where students focus on understandable learning while the other is the surface approach where students memorize facts without meaning and organization. The research literature on teaching revealed two different teaching approaches which are student centered with active teaching strategies and teacher centered with traditional expository teaching methods.

In this study data was collected from a sample of 385 A/L science students and 10 Chemistry teachers from five schools in the Kandy Educational Zone. He sample of students completed a written questionnaire containing two parts. He first part is the Learning Process Questionnaire (LPQ), ( Biggs, 1987) which was used to identify there learning preferences. In the second part student were asked to respond to open ended statements about there perceptions of teaching and learning in the designated class. In addition to that 40 students, 4 from each class and corresponding teaches were interviewed. These interviews focused on perceptions of teaching and learning in the class from both the student's and teacher's perspective. Approaches to Teaching Inventory (trigwell & Prosser,1996) along with class room observations were used to identify the teaching approaches.

Data was analyzed using qualitative and quantitative methods, in order to compare the perceptions of teaching and learning of students. Results of this study revealed that students with a preference for deep approaches to learning recognized and appreciated the learning potential of constructivist teaching practices. Students with a surface approach did not appreciate the learning potential of these activities. Further, when traditional expository teaching methods were used, almost all students adopted rote learning strategies. These findings confirm those reported by Campbell et al. (1996,2001), and suggest that students, especially those with surface approaches to learning need to be taught the skills and shown explicitly how to learn from varied active learning experiences.